# ක්‍රියාකාරකම - සතර අභිනය

## සතර අභිනය

- සතර අභිනය - ප්‍රේක්ෂකයන් හට කිසියම් අදහසක් ලබා දීම සඳහාත් රංගන අවස්ථා තීව්‍ර කර පෙන්වීම සඳහාත් සතර අභිනය භාවිතා කර ඇත.
- අභිනය යනු සංස්කෘත භාෂාවේ සඳහන් වචනයකි. භාරතමුනිගේ "නාට්‍ය ශාස්ත්‍රය" නැමති ග්‍රන්ථයේ අභිනය යන්න අර්ථ දක්වා ඇත්තේ "ඉදිරියට ගෙන ඒම" යන්නයි. අභිනය සතර ආකාර වේ. චතුර් විධ අභිනය යනුවෙන්ද සඳහන් කරන අතර එය පහත දැක්වේ.

1) ආංගික අභිනය
2) වාචික අභිනය
3) සාත්වික අභිනය
4) ආහාර්ය අභිනය වශයෙනි

- එමෙන්ම නන්දිකේෂ්වර විසින් රචනා කරන ලද "අභිනය දර්පණය" නම් කෘතියේද අභිනය පිළිබඳ සඳහන් ව ඇත. මෙය ශිව දෙවියන්ට කරන නමස්කාරයක් ලෙස මෙකී ග්‍රන්ථයෙහි ආරම්භයේම දක්වා ඇත.

"ආංගිකම් භුවනම් යස්‍ය
වාචිකම් සර්ව වාග්මයම්
ආහාර්යම් චන්ද්‍ර තාරාදි
තංත්‍රම: සාත්විකම් ශිවම්"

**චතුර්විධ අභිනයන් වෙන වෙනම හඳුනා ගනිමු.**

**ආංගික අභිනය**

- සතර අභිනයට අයත් බව
- නර්තනයක්, නාට්‍යයක කතාවක් හෝ සිද්ධියක් හෝ නළුවාගේ මාර්ගයෙන් ඉදිරියට ගෙන සහ ප්‍රධාන මෙවලම ආංගික අභිනයයි. එනම් ඉදිරිපත් කිරීමයි.
- අංග, ප්‍රත්‍යාංග හා උපාංග වශයෙන් ආංගික අභිනය කොටස් සහිත බව
- අංග - හිස, කඳ, දෑත්, දෙපා
- ප්‍රත්‍යාංග - බෙල්ල, උරබාහු, වැළමිටි, මැණික් කටුව
- උපාංග - ඇහිලි, ඇස, ඇහිබැම, තොල්
  (ඔබට අවබෝධයට පහසුව සඳහා වෙන් කොට දක්වමි.)

- වචනයෙන් කිව නොහැකි බොහෝ දේ ඇඟපසඟ හා හස්ත මුද්‍රා මෙන්ම නළුනිළියන්ගේ සංචලන මගින්ද දැක්විය හැකිය.
- එනම් අත්පා හැසිරවීම, ගමන් විලාස, හිදීම, සිටගැනීම, නිදාගැනීම, ආහාර ගැනීම ආදී සකල සාමාන්‍ය විශේෂිත ඉරියව් ආංගික අභිනය වේ. නාට්‍යයක් සාර්ථක වීම සඳහා ආංගික අභිනය ප්‍රබලව බලපානු ලැබේ.




**වාචික අභිනය**

- නාට්‍යයක දෙබස්, වචන, ගීත මගින් නාට්‍යයේ අර්ථය වාචිකව ඉදිරිපත් කිරීම වාචිකාභිනයයි. අදහස් ප්‍රකාශනයේදී වචන, ප්‍රබල මාධ්‍යයක් වේ. චරිතයක අදහස්, ආකල්ප, හැගීම්, ආවේග සියල්ල ප්‍රේක්ෂකයාට සෘජුවම සන්නිවේදනය වන්නේ වචන මාධ්‍ය කරගෙනය. එය නාට්‍යයේ සමස්ත හරයට සෘජුවම බලපාන නිසා ඉතා වැදගත් වේ. දේශීය ශාන්තිකර්ම වල සහ නාට්‍යමය අවස්ථා වලදීද අවස්ථා නිරූපනය සඳහා වාචික අභිනය යොදා ගෙන ඇත.
- ගායනය - නාට්‍ය වලට අයත් සංවාද හා දෙබස් මෙයට ඇතුලත් වේ.

    සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
    නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
    පද අල්ලන්නී පියයුරු ළැම සොල්ලන්නී
    කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

**සාත්වික අභිනය**

- නළුවාගේ නිළියගේ චරිතයට අදාළව මුහුණින් හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි.
- ආදරය, කරුණාව, ශෝකය, කෝපය වැනි මනෝභාවයන් ප්‍රේක්ෂකයා ඉදිරියේ මැවෙන්නේ සාත්වික අභිනය හරහාය. එපමණක් නොව මුහුණේ මස්පිඬු, නළල, ඇහිබැම, ඇස, කන, නාසය, නිකට යන ඉන්ද්‍රියන් තුළින් මනෝභාවයන් ප්‍රකට වේ. මුහුණේ හැඟීම් පමණක් ම නොව වෙවුලීම, කඳුළු සැලීම, දහදිය දැමීම වැනි ලක්ෂණ ද සාත්වික අභිනයට අයත් වේ. මෙය වඩාත් ප්‍රබල ලෙස ප්‍රේක්ෂකයාට දැක ගැනීම සඳහා අංග රචනයද උපකාරී වේ.

**ආහාර්ය අභිනය**

- පිටතින් ගන්නා සියළුම දෑ එනම් රංග වස්ත්‍රාභරණ භාවිතය, වෙස් ගැන්වීම, වේදිකා උපරකරණ හා සැරසිලි, රංග භාණ්ඩ භාවිතයෙන් අදහස් ප්‍රකාශ කිරීම යන සියල්ල ආහාර්ය අභිනයයි. නළුවා තම චරිතයට අදාළව අභ්‍යන්තරික මෙන්ම බාහිරින්

සමාරෝපණය විය යුතුය. එනම් තමා ඉදිරිපත් කරන චරිතයට අවේශ විය යුතුය. ප්‍රේක්ෂකයා එකවරම චරිතය හඳුනා ගන්නේ උචිත පරිදි සිදු කරන සමාරෝපයෙනි.

## <u>රංග වස්ත්‍රාභරණ</u>



<u>කතකලි රංග වස්ත්‍රාභරණ</u>

- ඉඩෝරි - යටිකයට අඳින රැළි ගැන්වූ සුදු පැහැ පිම්බුණු සාය
- කුප්පායම් - උඩුකයට අඳින අත් දිග විල්ලුද හැට්ටය
- උත්තරියම් - කරවටා දෙපසින් පහළට එල්ලෙන රැළි සහිත සළු (දෙකක් පළඳී)
- පතුවාල් - ඉණ දෙපසින් එල්ලා වැටෙන රතු පැහැ පටි
- කෝලාරම් - පපු පෙදෙසට පළඳින ආභරණයකි.
- පඩිඅරඤාණම් - ඉණට පළඳින ඉණ පටිය
- මූන්රි - ඉණට පළඳින ඉණ හැඩය
- කිරිටම්/ මුඩි - හිසට පළඳිනු ලබන ශීර්ෂාභරණයයි. (චරිත අනුව වර්ග කීපයකි)
- කුණ්ඩලම් (චේච්පු හා තෝඩා) - දෙකන් පෙදෙස අලංකාර කරයි.
- කළුතාරම් - ගෙලට පළඳින රන් පැහැ පබලු මාල වැල්
- තෝල්පූට්ටු - උරහිසට පළඳින උරබාහු
- පරිවිබායාමණී - තෝල්පූට්ටු ව සමඟ එහි පහළින් උරබාහුවට පළඳී
- වළ - දෑතට බන්ධී වළලු ( වැලමිටත් මැණික් කටුවත් අතරට)
- හස්තකටාකම් - මැණික්කටුවට පළඳින ආභරණයකි.
- නඛම් - රිදියෙන් කළ නිය
- චාමරම් - බොරු කොණ්ඩය
- විලංග - දෙපයේ වළලු කරට පළඳින ගෙජ්ජි
- කච්චාමණී - දෙපයේ බත්කෙණ්ඩට පළඳින ගෙජ්ජි

රංග වස්ත්‍රයන්ගේ වර්ණ එක් එක් චරිතයන්ට අනුව වෙනස් විය හැක.එමෙන්ම විචිත්‍රවත් වස්ත්‍ර භාවිත වේ.

පිටු අංක - 07

සැකසුම - නුවන් ගුරුගේ
නයන ශිල්ප කලායතනය

## <u>අංග රචනය</u>




## <u>රංගභූමි සැරසිලි</u>



<u>**රංග භාණ්ඩ**</u>







## <u>පැවරුම් පත්‍රිකාව</u>

1) නිවැරදි පිළිතුරු සපයන්න.
   - නන්දිකේශ්වර - සංවාද හා දෙබස්
   - භාරත මුණි - ආංගික අභිනය
   - වාචික අභිනය - අංග රචනය, පසුතල නිර්මාණ
   - ආහාර්යා අභිනය - නාට්‍ය ශාස්ත්‍රය
   - අංග, ප්‍රත්‍යාංග - අභිනය දර්පනය

2) සතර අභිනය නම් කරන්න.
3) ප්‍රකාශන විධි ක්‍රම අනුගමනය කරමින් දෙබස් හා සංවාද සහිතව කුඩා කතාවක් නිර්මාණය කරන්න.
4) ශාන්තිකර්මයක හෝ ගැමි නාටකයක හෝ දැක්වෙන නාට්‍යමය අවස්ථාවක් තෝරා ගෙන සතර අභිනයට උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
5) සාර්ථක නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමට සතර අභිනය උපයෝගී කරගත හැකි ආකාරය පිළිබඳ විස්තර කරන්න.
6) නරඹන ලද නාට්‍යයක ප්‍රේක්ෂක රසවින්දනයෙහිලා සතර අභිනය යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
   (උදාහරණ - ජාතික රූපවාහිනියේ රංග භූමි වැඩසටහන නැරඹීම ඉතා සුදුසුයි. ඉරිදා උදෑසන)